**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

Media Release

# සැබෑ ජීවිතයේ වීරයෙකුගේ සැබෑම කතාවක්

ජීවිත රක්ෂණ සැලසුමක් වෙනුවෙන් ආයෝජනයක් කරන්න තරුණයෙකුව කැමති කරගත්ත වෙලාවෙ ඒකෙන් තමන්ගෙම ජීවිතෙත් මහා පුදුමාකාර විදිහට වෙනස් වෙයි කියලා ඉෂාන් රංගජීව හීනෙන්වත් හිතුවෙ නැහැ. “ඒ තරුණයා ළඟ ලොකු මුදලක් තිබුණෙ නැහැ. ඇත්තටම එදා දවසට උදේටයි දවල්ටයි කෑවෙත් නැහැ කියලා ඔහු කිව්වාම, මට දැනුනේ ඒ ඔහු ඉතුරු කරන්න හදන නිසා වෙන්න ඇති කියලයි. ඉතින් මම ඔහුට දවල්ට කන්නත් අරගෙන දීලා, තමන්ගෙ අනාගතය සුරක්ෂිත කරගන්න ජීවිත රක්ෂණවරයක් ලබාගන්න ඔහුව කැමති කරව ගත්තා. ඔහු විවාහ වෙලා හිටියෙ නැති නිසා ප්‍රතිලාභියා විදිහට නම් කරන්නෙ කාවද කියලා හිතාගන්න ඔහුට පුළුවන්කමක් තිබුණෙත් නැහැ. එතකොට එතැනට ආපු ඔහුගෙ යාළුවෙක්, තමන්ව එයාගෙ ප්‍රතිලාභියා විදිහට නම් කරන්න කියලා විහිළුවට වගේ කිව්වා. ඒත් ඔහු ඇත්තටම ඒ යාළුවව ප්‍රතිලාභියා විදිහට නම් කළා.” රංගජීව ඒ සිද්ධිය සිහිපත් කළේ ඒ විදිහටයි.

මේ තරුණයා අසනීප වෙලා අනපේක්ෂිත සහ අවාසනාවන්ත විදිහට මිය ගියාට පස්සෙ තමයි ඒ තරුණයාගෙ අන්ධ අම්මා කිසිම හවිහරණක් නැතුව අසරණව ජීවත් වෙනවා කියලා රංගජීව දැනගත්තෙ. තරුණයාගෙ ජීවිත රක්ෂණාවරණයෙන් ලැබෙන මුදල් හිමි වෙන්නෙ යාළුවට මිසක් ඉතාම අසරණ වෙලා ඉන්න අර අම්මට නෙවෙයි කියලා දැනගත්තාම රංගජීව හරියට දුක් වුණා. රක්ෂණ වෘත්තිකයෙක් විදිහට තමන්ගෙ රාජකාරි සීමාවෙන් එහාට ගිහින්, තමන්ගෙ රක්ෂණවර හිමියාගෙ අම්මට උදව් කරන්න රංගජීව එක හිතින් හිතාගත්තා. අර යාළුවව හමු වෙන්න ගිය ඔහු, ලැබෙන්න නියමිතව තිබුණු ප්‍රතිලාභ මුදල තරුණයගෙ අම්මට ලබාදෙන්න යාළුවව කෙසේ හෝ කැමති කරගත්තා. ඒකෙන් ඇත්තටම ඇගේ ජීවිතයේ ලොකු වෙනසක් වුණා.

රක්ෂණවර හිමියෙකුගේ ආදරණීය අම්මට උදව් කරන්න තමන්ගෙ සීමාවෙන් ඔබ්බට ගිය රංගජීව ගත්තු ඒ උත්සාහය නිසාම ඔහු AIA සමූහයේ 'සැබෑ ජීවිතයේ වීරයෙක්' විදිහට ඇගයීමට ලක් වුණා. වෘත්තීයභාවය සහ තමන්ගේ සේවය ලබන අයගේ සුභසිද්ධිය වෙනුවෙන් දක්වපු සැලකිල්ල වෙනුවෙනුත් ඔහු ඇගයීමට පාත්‍ර වුණා.

සැබෑ ජීවිතයේ වීරයෙක් විදිහට මුළු ආසියාවෙන්ම මුල් වටයට නම් කෙරුණු කලාපීය ජයග්‍රාහකයින් 15 දෙනා අතරින් ශ්‍රී ලංකාවේ, මහරගම ප්‍රාදේශීය කාර්යාලයේ ඉෂාන් රංගජීව අවසන් වටයේ විශිෂ්ටතමයින් හය දෙනා අතරට ඇවිත් හිටියා. මේ වගේ වීර වික්‍රමාන්විත ජයග්‍රහණ ඇගයීමට ලක් කරන්න මේ අවුරුද්දෙ අග භාගයෙදි පැවැත්වෙන විශේෂ උත්සවයකට සහභාගි වෙන්න කියලා මේ ජයග්‍රාහකයින්ට ආරාධනා ලැබුණාම රංගජීවගෙ මේ හද සසල කරවන කතාව නිසා හොංකොං නුවරදි ඔහු ඇගයීමට සහ ප්‍රණාමයට ලක් වේවි. මේ අවස්ථාවට සහභාගි වෙන අනෙක් ජයග්‍රාහකයින් අතරෙ තායිලන්තය, කොරියාව, සිංගප්පූරුව නියෝජනය කරන අය වගේම මැලේසියාවෙනුත් ඉදිරිපත් වෙන දෙන්නෙකුත් ඉන්නවා.

"රංගජීවගේ ජයග්‍රහණය ඇත්තටම සතුටින් සමරන්න තරම් වටිනා අවස්ථාවක්.", ශ්‍රී ලංකා AIA සමාගමේ නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී උපුල් විජේසිංහ කියනවා. ඔහු ඒ ගැන වැඩිදුරටත් අදහස් දක්වන්නේ මෙහෙමයි: "සමහර වෙලාවට බොහෝ අය රක්ෂණය කියන දේ ගණන් ගන්නේ හෝ වැදගත් කොට සලකන්නේ නැති වුණත්, රංගජීව වගේ අපේ වෙල්ත් ප්ලෑනර්වරුන්ගේ මෙවැනි උත්සාහයන් මගින් ඔවුන් අපේ සමාජය වෙනුවෙන් ඉටු කරන උදාර සේවයේ අගය විදහා දක්වෙනවා. රක්ෂණ අලෙවිය කියන්නේ රස්සාවක් පමණක් නොව, සමාජයට ඉටුකරන්නා වූ වැදගත් සේවාවක් හා විශාල කැපකිරීමක් අවශ්‍ය වන ජීවන මාර්ගයක් හැටියට සලකමින් කටයුතු කරන අපගේ වෙල්ත් ප්ලෑනර්වරුන්ගේ විශිෂ්ටත්වයත් මෙයින් විදහා දක්වෙනවා."

**මාධ්‍ය විමසීම්: සුරේන් පෙරේරා, අලෙවි අංශ ප්‍රධානී සහ සමාගම් ප්‍රකාශක**

**කාර්යාලයීය - 2310028, ජංගම - 0773 457 959**

වූ